# දිනන දකුණ

දක්ෂිණාංශික දේශපාලනය ප්‍රතිස්ථාපනය කිරීමේ සාමූහිකය.

මාධ්‍ය නිවේදනය.

2026.05.07.

**<u>ද්විත්ව පුරවැසිභාවය සම්බන්ධව වගකීමක් සහිත පිළිතුරක් ලබා දෙන්න.</u>**

භාණ්ඩාගාර ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතාගේ ද්විත්ව පුරවැසි භාවය පිළිබඳව අප විසින් ප්‍රශ්න කර දින තුනක් ගතව ඇත.

ලේකම්වරයා ඒ සඳහා පිළිගත හැකි සාක්ෂි සාධක සහිත පිළිතුරක් මෙතෙක් ලබාදී නොමැත.

එසේ වුවද පසුගිය අඟහරුවාදා කැබිනට් ප්‍රකාශක අමාත්‍ය නලින්ද ජයතිස්ස මහතා " *මම බොහොම වගකීමෙන් කියනවා.මුදල් ලේකම් හර්ෂන සූරියප්පෙරුම ද්විත්ව පුරවැසියෙක් නෙවෙයි.*
කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමුවේදී කිසිදු වගකීමකින් තොරව ලබාදුන් පිළිතුර ජනමාධ්‍ය වාර්තා කර තිබිණි.

ඔහුගේ එම පිළිතුර කිසිසේත් අපට වගකීමක් සහිත පිළිතුරක් ලෙස භාරගත නොහැක්කේ මීට පෙර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කතානායක අශෝක සපුමල් රන්වල මහතාගේ ආචාර්ය උපාධි සහතිකය සම්බන්ධයෙන්ද කිසිදු වගකීමකින් තොර පිළිතුරක් ලබාදී,එම පිළිතුරට හාත්පසින්ම වෙනස් තත්ත්වයක් නිර්මාණය වෙමින් රන්වල මහතා කථානායක ධූරයෙන්ද ඉල්ලා අස්විය.

සමාජය තුළ සෘජුව චෝදනාව එල්ල වී ඇති භාණ්ඩාගාර ලේකම් ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම මහතා වෙනුවට වෙනත් පුද්ගලයින් හුදු දේශපාලනිකව සිදු කරන ප්‍රකාශ අප කිසිසේත් පිළි නොගන්නා අතර,කඩිනමින් සූරියප්පෙරුම මහතා තමන්ට එල්ල වන මෙම බරපතළ චෝදනාව නිවැරදි කර ගැනීම සඳහා සාධක සාක්ෂි සහිතව ඉදිරිපත් කරන ලෙස යළිත් දිනන දකුණ සාමූහිකය අවධාරණය කර සිටින්නෙමු.

දිනන දකුණ සාමූහිකය වෙනුවෙන්.

නායකත්ව මණ්ඩල සාමාජික නීතිඥ ශිරාල් ලක්තිලක.
නායකත්ව මණ්ඩල සාමාජික ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න.
නායකත්ව මණ්ඩල සාමාජික නදීෂ ද සිල්වා.
මාධ්‍ය ප්‍රකාශක තුෂාර වීරරත්න.